කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව -2023

------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ අංක 3.29 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දිගු කාලීන වත්කම් සහ වෙනත් ආයෝජනවල අත්පත් කර ගැනීම් සහ බැහැර කිරීම් ඇතුලත් කළ යුතු වුවත් දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.21,745,156 ක් අඩුවෙන් ද ආයෝජන රු.9,073,419 ක් වැඩියෙන්ද පොලී ආදායම රු.11,394,314 ක් අඩුවෙන් ද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ගලපා තිබුණි. | 2024 ගිණුමේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව | අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ අංක 3.30 ප්‍රකාරව මූල්‍යකරණ ක්‍රියාකාරකම් යටතේ ණය ආපසු ගෙවීම් රු.8,163,272ක් දැක්විය යුතු වුවද, රු.2,445,792 ක ණය ලබාගැනීමක් ලෙස ගැලපීම් කර තිබීම හේතුවෙන් මුදල් ගලායාම් රු.8,163,272ක් අඩුවෙන් ද මුදල් ගලාඒම් රු. 2,445,792 ක් වැඩියෙන් ද දක්වා තිබුණු අතර බැංකු ශේෂය රු.56,934,729 ක් වැඩියෙන් ද දක්වා තිබුණි. | 2024 ගිණුමේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව | අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය රු.144,421ක් අඩුවෙන් ගණනය කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ තොගය ඇතුලත් වෙන්දේසි කරන ලද අබලන් වූ භාණ්ඩ තොගයේ පිරිවැය වූ රු.29,244 ක් වර්ෂයේ වියදමක් ලෙස කපාහරිනු වෙනුවට සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | පෙර වර්ෂයන්හි මිලදී ගැනීමක් වන බැවින් මේ ආකාරයට සමුච්චිතයට ගලපා ඇති බව, | - එම - |
| (ඇ) | ණය පොලී රු.137,310 ක් මූල්‍ය වියදමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට විවිධ වියදම් ගිණුමට හර කර තිබුණි. | පිළිගනිමි. | - එම - |
| (ඈ) | වසර 02 ක් ඉක්මවූ තැන්පතු රු.3,613,696 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගලපනු වෙනුවට සමුච්චිතයට ගලපා තිබුණි. | වසර දෙකකට පෙර ලබාගත් තැන්පතු බැවින් සමුච්චිත අරමුදලට ගලපා ඇති බව. | - එම - |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට සෘජු ප්‍රේෂණ ලෙස වැටුප් ප්‍රතිපූර්ණය වෙනුවෙන් ලැබුණු රු.14,056,599ක් ණය වාරික වෙනුවෙන් ලැබුණු රු.20,683ක් ලද ස්ථාවර තැන්පතු පොළිය රු.3,208,767ක් හා වෙනත් ලැබීම් රු.11,333ක් වූ එකතුව රු.17,297,382ක් අදාල ගිණුම්වලට ගලපා නොතිබුණි. | අදාළ වටිනාකම බිල්කිරීම් සමඟ ගලපා ලැබිය යුතු ලෙස අදාළ ගිණුම් වල ගැලපී ඇති බව, දන්වා තිබුණද 2024 වර්ෂයේ ගිණුම් වලට ගලපා ඇති බව වාචිකව දන්වන ලද බව. | - එම - |
| (ඊ) | ගොඩනැගිලි ගිණුමටත්, සවිකිරීම් ගිණුමටත්, මංමාවත් ගිණුමටත් පිළිවෙලින් හර විය යුතු රු.90,683ක්, රු.1,155,118 ක්, රු.614,468 ක් වූ එකතුව රු.1,860,269ක් විවිධ වියදම් ගිණුමට හර කර තිබුණි. | 2024 ගිණුමේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතේ 127 වගන්තිය ප්‍රකාරව සුසාන භූමි හා මිනී පිටි ආඥා පනතේ 3 වගන්තිය හා 128 වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සුසාන භූමි 05ක සීමා නිර්ණයන් තීරණය කොට සභාවට පවරා ගෙන ගැසට් කිරීමට පියවර ගෙන නොතිබුණි. | සභාව සතු සුසාන භූමි සීමා නීර්ණයන් කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර, ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කර ඇත. අදාළ අනුමැතිය ලද විගස ගැසට් කිරීමේ කටයුතු සිදු කරන බව . | ගැසට් කිරීමේ කටයුතු ද නොපමාව ඉටුකළ යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | (ii) මු.රෙ 104(1) (අ)<br>මු.රෙ 104 (3)<br>මු.රෙ 104 (4) | 2021 වර්ෂයේ සිට 2023 ජුනි 30 දක්වා සිදු වූ වාහන අනතුරු 42 ක් සම්බන්ධයෙන් හේතු නිශ්චය කර ගැනීමත්, වගකිවයුත්තන්ට මූලික පරීක්ෂණයක් සිදුකර ඊට අදාළ හානි පාඩු අයකරගෙන නොතිබුණි. | 2021 වසරේ සිට 2023.06.30 දක්වා සිදු වී ඇති මුළු අනතුරු ගණන 17කි. ඒ අනුව, 2021 වසරේ අනතුරු 06ක් ද, 2022 වසරේ අනතුරු 05 ක්ද, 2023 වසරේ අනතුරු 06ක් ද වශයෙනි. මෙම සිදු වූ සියළුම හානි සඳහා රක්ෂණාවරණය මඟින් අලාභය ආවරණය කරගෙන ඇති අතර, 2021 හා 2022 වසරේ සිදු වූ අනතුරු සඳහා මුදල් රෙගුලාසි 110 ආකෘතිය ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කිරීමටත්, 2023 වර්ෂයේදී සිදු වූ අනතුරු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදු කොට මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදුකර ඇති බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 | සභාව සතු වාහන 50 ක පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | මේ වන විට 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3.1 වගන්තිය ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව මාස 06කට වරක් සිදු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු. 73,425,256 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.67,206,396ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකුවක පවත්වා ගෙන යන ජංගම ගිණුමට අදාල බැංකු සැසැඳුම අනුව වාසිදායක ශේෂය රු.63,088,827 ක් විය. එහෙත් මෙම ජංගම ගිණුමේ මුදල් කෙටිකාලීන තැන්පතුවක තාවකාලිකව හෝ ආයෝජනය කර පොළී ආදායමක් ලබාගැනීම සම්බන්ධයෙන් සභාව අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | 2023 දෙසැම්බර් මස 31 දිනට ඇති ශේෂයෙන්ද අතිරික්තව ඇති මුදල් ප්‍රමාණය විශේෂ ව්‍යාපෘති සඳහා ආයෝජනය කරන තෙක් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කිරීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. | අතිරික්ත මුදල් තිබේ නම් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් විෂයය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල් කිරීම්** | **රැස්කල ආදායම** | **2023 දෙසැ.31 දිනට සමුච්චිත හිඟය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල් කිරීම්** | **රැස්කල ආදායම** | **2022දෙසැ.31 දිනට සමුච්චිත හිඟය** |
| | **'000** | **'000** | **'000** | **'000** | **'000** | **'000** | **'000** | **'000** |
| (i) වරිපනම් බදු | 68,757 | 48,736 | 49,212 | 60,684 | 69,331 | 50,221 | 50,087 | 55,201 |
| (ii) කුලී | 11,889 | 11,530 | 12,243 | 34,948 | 21,000 | 6,832 | 4,628 | 7,237 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,450 | 600 | 1,149 | - | 1,700 | 1,700 | 1,450 | 250 |
| (iv) වෙනත් ආදායම් | 8,511 | 3,567 | 3,567 | - | 23,481 | 23,481 | 25,200 | - |
| එකතුව | 90,607 | 64,433 | 66,171 | 95,632 | 115,512 | 82,234 | 81,365 | 62,688 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් හා බදු වටිනාකම රු.60,684,236ක් වූ අතර එයින් රු.40,000කට වඩා වැඩි හිඟ වටිනාකමක් ඇති වරිපනම් හිඟ ශේෂ 45කින් අයවිය යුතුව තිබූ මුදල රු.5,743,876ක් විය. එය මුළු හිඟයෙන් සියයට 9.5 ක් පමණ විය. | හිඟ ශේෂ ඇතුලත් දේපළ සියල්ලම ස්ථානීය පරීක්ෂණ සිදුකොට හඳුනා ගෙන ඇති අතර, හිඟ වරිපනම් බදු මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ලිපි මඟින් ද දැනුවත් කර ඇති බව. | වර්ෂ ගණනාවක සිට අයවිය යුතුව පවතින හිඟ ආදායම් රැස්කිරීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | සභාවේ ප්‍රධාන කාර්යාලයට අයත් කඩ කාමර 146කින් කඩ කාමර 99ක සහ උප කාර්යාලයට අයත් කඩකාමර 99කින් කඩ කාමර 48කින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.26,953,872 ක් විය. වර්ෂය තුළදී ලැබී ඇති මුළු කඩකුලී රු.11,370,780ක් වූ අතර එයින් රු. 9,411,341ක් පෙර වර්ෂයන් සඳහා වූ හිඟ කඩකුලී අයකිරීම් විය. | 2019.10.01 සිට 2022.12.31 දින දක්වා නව කුලී තක්සේරු ප්‍රතිශෝධනය මත බදුකරුවන් විසින් කුලී ගෙවීම් ප්‍රතික්ෂේප කළ අතර, ඒ අනුව මෙම හිඟ මුදල අයකර ගැනීමට නොහැකි විය. | කඩ කුලී ගෙවීම පැහැර හරින්නන්ගේ කඩ කාමර ආපසු පවරා ගැනීම වැනි විකල්ප ක්‍රම මඟින් හිඟ කඩකාමර කුලී අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ඇ) | 2023 වර්ෂය ආරම්භයේ ලැබිය යුතු කුලී ආදායම රු.2,600,609ක් වූ අතර වර්ෂය තුළදී එයින් රු.769,835ක් පමණක් අයකරගෙන තිබුණු අතර එය සියයට 29 ක් විය. සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම රු.2,894,040 ක් වූ අතර එයින් රු.103,135 ක් පමණක් අයකරගෙන තිබුණු අතර එය සියයට 3.5 ක් විය. | 2019.10.01 සිට 2022.12.31 දින දක්වා නව කුලී තක්සේරු ප්‍රතිශෝධනය මත බදුකරුවන් විසින් කුලී ගෙවීම් ප්‍රතික්ෂේප කළ අතර, ඒ අනුව මෙම හිඟ මුදල අයකර ගැනීමට නොහැකි විය. | හිඟ නිවාස කුලී අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ඈ) | පලාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.7,474,965ක් හා මුද්දර ගාස්තු රු.97,172,883ක් විය. | ලබාදුන් උප ලේඛන අනුව ගාස්තු ලැබී ඇති බව දන්වා සිටිමි. | ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතු යුතුය.. |

## 2 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බලප්‍රදේශයේ පදිංචිකරුවන් විසින් සමාලෝචිත වර්ෂය තුළදී එක් එක් කාණ්ඩ යටතේ පැමිණිලි 271 ක් සභාව වෙත ඉදිරිපත්කර තිබුණු අතර එයින් පැමිණිලි 53 ක් විසඳා නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති සියළුම පැමිණිලි සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අදාල කාලසීමාව තුළදී පැමිණිලි විසඳිය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | | |
| --- | --- | --- |
| සභාව විසින් කසල අංගනයේ කසල මත මීතේන් වායුව නිෂ්පාදනය වීමෙන් හටගත් ගින්න මැඩපැවැත්වීම සඳහා Long Arm Excavator යන්ත්‍රයක් මාස 03 ක කාලයක් සඳහා කුලී පදනම මත ලබාගෙන තිබුණි. අදාල කාලසීමාව තුළ යන්ත්‍ර පැය 620.7 ක් ධාවනය කර රු.8,534,625 ක් ගෙවා තිබුණ ද වැඩ අධිකාරී විසින් කසල අංගනය පරීක්ෂාවට ලක් කිරීමේදී යන්ත්‍රය ධාවනය කළ පැය ගණන පිළිබඳව කිසිදු අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මාස 03ක කාලයක් සඳහා කුලී පදනම මත ලබාගන්නා ලද යන්ත්‍රය කසල අංගනයේ කාණු කැපීම හා විකල්ප මාර්ග සැකසීම සඳහා යොදාගත් බව තාක්ෂණ නිලධාරී අධීක්ෂණය කර නිර්දේශ කිරීමෙන් අනතුරුව වැඩ අධිකාරී ගෙවීම් නිර්දේශ කර ගෙවීම් සිදු කර ඇති බව. | නිසි පරිදි ලේඛන පවත්වාගෙන යාමත් නිසි පරිදි අධීක්ෂණ කටයුතු සිදුකිරීමත් කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත කාර්ය මණ්ඩලයට අමතරව අංක 25/2014 හා 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබූ සේවකයින් 61 ක් ද, අංක 29/2019 හා 2019 සැප්තැම්බර් 18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබූ සේවකයින් | පිළිතුරු ලබා දී නැත. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්තය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය.. |

29 ක් ඇතුළුව මුළු සේවකයින් 87 දෙනෙකු සේවයෙහි නිරත වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ අයවැය ලේඛනයෙන් මුදල් ප්‍රතිපාදන ඇතිකරගෙන අපේක්ෂිත කාර්යයන් සිදුකර නොතිබීම හෝ අවශ්‍ය නොවීම නිසා පුනරාවර්තන වැය විෂයයන් 18 ක රු.20,411,636 ක්ද මූලධන වැය විෂයයන් 02 ක රු.1,499,100 ක මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 රාජ්‍ය වියදම් පාලනය කිරීමේ උපදෙස් මත අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ කාර්යයන් පමණක් සිදු කිරීම මත මෙලෙස පුනරාවර්තන හා මූලධන වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා සිටිමි. | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතු වන අතර ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කළ යුතුය. |